# පිළිතුරු

Hasitha Hettiarachchi
071-9020298

## බසින් රස මවන සාහිත්‍යය

Nimthaka

ගද්‍ය හා පද්‍ය නවකතා, කෙටිකතා ආදී නිර්මාණාත්මක කෘති භාෂාව මාර්ගයෙන් අසන්නාගේ හෝ කියවන්නාගේ සිතෙහි රසයක් හා චමත්කාරයක් ඇති කරන නිර්මාණ සාහිත්‍ය යනුවෙන් හඳුන්වයි.

1. සූරිය මල අතරෙන් සාවුළු සිනා මවනා
   හිමිදිරියේ
   අග නගරේ .... - (සූරිය මල) පරාක්‍රම
   කොඩිතුවක්කු.

2. ඉහළ වෙරළ ඉස්මත්තේ
   දිය ගොබල්ල මල් ගොල්ලේ
   නීල වරල උඩ හෙළාලා .... - (කොතා
   විය මල) මහගම සේකර

3. පසුගිය රාත්‍රිය ද සඳ එළියෙන් ඉතා
   ම ප්‍රසන්න විය. සැම තැනක්හි පැතිර
   ප ඉතිර ගිය සඳ කැළුම් නිසා සිතාවකා
   ලොමින් ගොනා, සඳ ගැබක් මෙන්
   ... (සුනේත්‍රා) ඩබ්ලිව් ඒ සිල්වා.

(04) දෙමව්පියන්ගේ අවවාදයෙන් ද අසංග
-යන්ගේ මැදහත්කමින් ද පරිපීඩිත
සත් ඇති... (විජයබා කොල්ලය)
ඩබ්ලිව් .ඒ. සිල්වා.

(05) "උදේ වරුවේ නොකඩවා පැමිණි චිරි
චිරි වැස්සෙන් පසු සුව ද පහසු
ගෙන දෙන සිසිල් සුළඟ හමනවා...
(සඳා මෙලෙස පුර දෙරණේ) ඒ.වී
සුරවීර.

(06) මැණි විලා කළ, පෑ කාලි යැයි ඔබේ
නො හොබිනි සි ඔහිස් ලෙළු නො
සතොස් නොවන්.
සිරුර පැලයෙනු ගන් සඳතෝ ලොවේ
නො හැලුනාන් උතුමින් ඉරුයෙන්

විනා... (මැණි විලා කළ) කුමාර
තුංග මුනිදාස.

(07) ඕස නාමා ගෙනි ඇද
සිහිනේ රතැඹිලි පවලමා ගෙනි,
සනියෙකට පෙර ගෙනා වර
විලිබරයා මගේ රන්වන් මනාලිය
(අලුත ගෙනා මනාලිය) ජී.බී. සේනානා
යක.

(උදා) පෙරළිය ගොරහැඬි රළුවෝ
මගේ ධාරාවිය අයි හඬනුවෝ
නිදා ගන්නා පෙරවිගෙනෝනා
සාලු රෙදි ගොට
මෝසාට ද මේ
නීරුපිලට් ගුරා උමන්ගෙනි.
(උදය) සිරි දහසිංහ

## අවබෝධය

1. කවියාගේ වාක්කෝෂයත් විද්‍යා ලේඛකයාගේ වාක්කෝෂයත් අතර ඇති වෙනස කුමක් ද?
2. සාහිත්‍ය නිර්මාණයක දී වචනවල භාවික ගුණය යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.
3. සාහිත්‍යකරුවාගේ ප්‍රතිභාව ප්‍රකට කළ හැකි ප්‍රධාන මාධ්‍යය ලෙස මෙහි සඳහන් වන්නේ කුමක් ද?
4. "සාහිත්‍ය නිර්මාණයක දී වාච්‍යාර්ථය ඉක්මවා ව්‍යංග්‍යාර්ථය ජනනය කරන ආකාරයට කවියා බස හසුරුවයි." යන ප්‍රකාශයෙහි අර්ථය විමසන්න.

(1) කවියාගේ වාක්කෝෂය භාවිත ගුණයට මුල් තැන දෙන අතර විද්‍යා ලේඛකයාගේ වාක් කෝෂය වාත් හිතීය ට මුල්තැන දෙයි.

(2) භාවිත ගුණය යනු රසිකයාගෙන් ප්‍රබෝධ -වත් කොට ඔහු මැනවින් අත්දැකීමට සහ -භාගී කර ගැනී~~මයි~~ මේ හැකියාවයි.

(3) ~~ගොගෙව.~~ භාෂාව

(4) මහාගම සේකර මහතා රචනා කර ඇති සක්වා ලිහිණි පද්‍ය පන්තියේ එන කාරුණයා කාරුණිකයෙක් කෙරෙහි ඇති වන ප්‍රේමය නිසා ~~සිය~~ දිවියේ කටුක බව දරා ගනිමින් ~~තම~~ නවදිවියක් පිළිබඳව ඇති කරගන්නා අපේක්ෂාව නිල ගොයම කිරි වැදි~~ස~~ලා යනු යෙදුමින් නිරූපණය කෙරේ. මෙලෙස වචනයේ ~~එන~~ අර්ථය ඉක්මවා වෙනත් අර්ථයක් නිරූපණය කිරීමට කවියෙකුට හැක.

## ලිඛිත අභ්‍යාස

1. පාඩමෙහි අන්තර්ගත කරුණු සැලකිල්ලට ගෙන පහත දැක්වෙන පද්‍ය පන්තියෙහි භාෂාවේ සුවිශේෂත්වය හඳුනාගෙන විචාරය කරන්න.

### පැණි කොමඩු

පැණි කොමඩු වැල
යන එන සෑම තැනක ම
තියා යනවාමයි ගෙඩියක්
හේන මත
තහවුරු කරන්නට තම අයිතිය

ඒ විතරක් ම නො ව
කැකිරි වැල් හා එක් ව
හිනා වෙනවා ඇද කර කර
බතල වැල්වලට
හිස් අතින් ඉන්නවට
කොළ විතරක් ම වන වන
කෝම හරි මේ ළඟ දි
අලි ගැහැව්වට පස්සෙ ඔය හේනට
කැකිරි වැල් දරුදඬු ව
කොමඩු ගෙඩි ආගිය අතක් නැත
බතල වැල් ටිකත් සී සී කඩ

පාළුවට ගිය හේනක් නම් තමයි දැන් එය
ඒත් තාමත් හේන ගාවින් යන අය
ඇහෙන බැව් කියනවා
බතල අල වගයක් හුස්මගන්නා හඬ
හෙමිහිට

රුවන් බන්දුජීව

හේන් ගොවිතැනේදී ගොවියා විඳින කරදරය, දුක ඉදිරිපත් කිරීමට ගත් උත්සාහයක් ලෙස රචිත මෙම පද්‍ය පංතිය සඳහා කවියා ගැමි බස මුසු රසවත් සරල භාෂාවක් යොදා ගෙන ඇත. පැණි කොමඩු වැල තම අයිතිය තහවුරු කරන්නට මෙන් විශාල ගෙඩි ඇති කරයි. මෙය සමාජ නිරූපණයක් ලෙසද සැලකිය හැකිය. සමාජයේ ඇතැම් පුද්ගලයන්ගේ ක්‍රියා කලාපය පැණි කොමඩු වැලේ ක්‍රියා කලාපය වැනිය.

**පැණි කොමඩු වැල**
**යන එන සැම තැනක ම**
**තියා යනවාමයි ගෙඩියක්**
**හේන මත**
**තහවුරු කරන්නට තම අයිතිය ...**

කැකිරි වැල්ද කොමඩු වැල් සමග එකතු වී තම අණසක පතුරද්දී බතල වැල් වලට ඔච්චම් කරයි.

**හිනා වෙනවා ඇද කර කර**
**බතල වැල්වලට ...**

ආදී ලෙස කවියා දක්වන්නේ සරල ගැමි වහරේ යෙදුම්ද තම නිර්මාණයට මනා ලෙස ගළපා ගනිමින් ය.

එහෙත් අවසානයේ සිදු වන්නේ කුමක් ද? වන අලියන් විසින් හානියට පත් වන වගා බිමේ කලින් අණසක පැතිරවූ කොමඩු හෝ කැකිරි දකින්නටවත් නැත. එහෙත් සමච්චලයට ලක් වූ බතල වැල් යළි දළු ලා වැඩෙන බවක් කවියා අවසානයට කියයි.

**ඇහෙන බැව් කියනවා**
**බතල අල වගයක් හුස්මගන්නා හඬ**
**හෙමිහිට ...**

සමාජ යථාර්තයද එබඳුය. සොබාදහමට අනුගතව සියලූ දුක් වේදනා ඉවසාගෙන නොසැලී අභියෝග වලට මුහුණ දෙන බතල වැල් වැනි මිනිසුන්ට කවදා හෝ සුබ කල දසාවක් උදාවනු ඇත. පෙර තමන්ට සරදම් කළ අය ඒ වන විට දකින්නටවත් නැත. මෙලෙස සමාජ යථාර්තය සැබෑ අත්දැකීමක් ඇසුරින් ප්‍රතිනිර්මාණය කිරීමට කවියා ගත් උත්සාහය අගය කළ හැකිය.

මෙලෙස ගත් කළ පැණි කොමඩු සාර්ථක කාව්‍ය නිර්මාණයක් බව අවිවාදාත්මකය.

### අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| සුසංයෝජනය | - | මැනවින් සංයෝජනය වූ |
| කාව්‍යෝක්ති | - | කාව්‍යමය/ කාව්‍යය සඳහා යොදා ගන්නා කියමන් |
| වාච්‍යාර්ථ | - | මතු පිට අර්ථය |
| විස්මයාවහ | - | පුදුම උපදවන |
| වාක්කෝෂය | - | වචන සමූහය, වචන සංග්‍රහය |
| පරිපෝෂිත | - | මනාව පෝෂණය වූ |
| ප්‍රහර්ෂය | - | අධික සන්තෝෂය |
| විස්මයෝත්ඵුල්ල නයනයෙන් | - | පුදුමයෙන් පිරී ගිය ඇසින් |
| සර්වාංගය | - | සියලු ශරීරය |
| ගාම්භීරත්වය | - | ගැඹුරු බව |
| චිරන්තන | - | පුරාණ කාලයට අයත්, පෞරාණික |
| උක්තීන් | - | කියමන් |
| ධ්වනිපූර්ණ | - | මතුපිට අර්ථය ඉක්මවා යන සැඟවුණු අර්ථයකින් පෝෂණය වූ |
| අවස්ථෝචිත | - | අවස්ථාවට සුදුසු, තැනටත් කාලයටත් ගැළපෙන |
| හසළත්වය | - | මැනවින් පුරුදු පුහුණු බව/ නිපුණත්වය |
| පරිකල්පනය | - | සාහිත්‍ය කලා නිර්මාණය සඳහා අවශ්‍ය දෑ සිතින් මවා ගැනීම |